සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය - I

**නම/විභාග අංකය :-** ........................................................ **කාලය: පැය 01 යි.**

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ද්‍රව්‍ය මගින් ඉටු කරන ඉබාදතයකි
(1) සලාත් (2) සව්ම් (3) සකාත් (4) තිලාවත්

(02) අකීදාවට පටහැනිව දේශපාලනිකව බිහිවූ කණ්ඩායමක් වන්නේ,
(1) කවාරිජ් (2) ශීආ (3) මුඃතසීලා (4) ජබරිස්යා

(03) විශ්වාසය හා සම්බන්ධව බිහිවූ කලාව
(1) ෆික්හ් (2) තෆ්සීර් (3) වරාසත් (4) අකාඉද්

(04) මුඃ තසීලා චින්තනයට විරුද්ධ ව සටන් කළ ඉමාම් වරයා,
(1) ඉමාම් අහ්මද්තුමා (2) ඉමාම් ෂාෆිඊතුමා (3) ඉමාම් අබුමන්සූර්තුමා (4) ඉමාම් අබුජඃෆර්තුමා

(05) "තව්හීද්" හි විරුද්ධ පදය,
(1) කුෆ්ර් (2) ෂිර්ක් (3) රිද්දත් (4) ඉල්හාද්

(06) භාෂාමය වශයෙන් "සැඟවීම" යන අර්ථය ලබාදෙන පදය,
(1) ඉල්හාද් (2) රිද්දත් (3) කුෆ්ර් (4) නිෆාක්

(07) ව්‍යාජ නබිවරුන් අතරින් කාන්තා නබිවරිය,
(1) තුලෛහා (2) මුසෛලමා (3) අස්වදුල්අන්සි (4) සජාහ්

(08) පශු සම්පත් අතරින් ගවයන්ගේ නිසාබය වන්නේ,
(1) 40 කි. (2) 30 කි. (3) 5 කි. (4) 25 කි.

(09) ධාන්‍ය සඳහා ආරම්භ නිසාබය,
(1) 689.5kg (2) 688.5kg (3) 698.5kg (4) 900kg

(10) සකාත් අනිවාර්යවන පලතුරු වර්ග වන්නේ,
(1) රටඉඳි, දොඩම් (2) රටඉඳි, මිදි (3) රටඉඳි, වී (4) මිදි, අඹ

(11) රිදී සඳහා ආරම්භ නිසාබය වන්නේ,
(1) දිර්හම් 150 කි. (2) දිර්හම් 180 කි. (3) දිර්හම් 200 කි. (4) දිර්හම් 300 කි

(12) නිසාබ් තත්වයට පත් වූ නිදන් සඳහා ලබාදිය යුතු සකාත් ප්‍රමාණය,
(1) 10% (2) 15% (3) 17% (4) 20%

(13) සකාත් ලැබීමට සුදුසු අතරින් "අන්තදුගියා" යනු
(1) මිස්කීන් (2) කාරිමුත් (3) ෆකීර් (4) ආමිල්

(14) "ඉල්හාද්" යන අරාබි පදයෙන් හැඟවෙන්නේ,
(1) ආදේශ කිරීම (2) අදේව වාදය (3) ඉස්ලාමයෙන් බැහැරවීම (4) ප්‍රතික්ෂේප කිරීම

(15) නිවැරදි අකීදාව අනුගමනය කරන්නන්,
(1) ජබරිය්‍යා (2) කවාරිජ් (3) අහ්ලුස් සුන්නා වල්ජමාආ (4) ෂීආ

(16) ඉද්රීස් (අලෛ) හට ප්‍රදානය කරන ලද සුහුෆ් සංඛ්‍යාව
(1) 10 කි (2) 30 කි. (3) 50 කි. (4) 20 කි.

(17) කය හා ක්‍රියාවට සම්බන්ධවන ඉබාදතයකි,
(1) හජ් (2) සකාත් (3) උළුහිය්‍යා (4) දික්ර්

(18) අවසන් අත්තහිය්‍යාත් හිඳුම,
(1) ජුලුස් (2) ඉෆ්තිරාෂ් (3) ඉස්තිරාහත් (4) තවර්රුක්

(19) දාවුද් (අලෛ) තුමාට පහළ වූ ආගම,
(1) සබූර් (2) ඉන්ජීල් (3) ෆුර්කාන් (4) තව්රාත්

(20) ''කලා" යන වචනයට අදාළ නොවන දේ,
(1) මැවීම (2) විසඳීම (3) අභිමතය (4) ඉෂ්ඨ කිරීම

(21) "නජ්ද්" ප්‍රදේශයට අයත් ව්‍යාජ නබිවරයෙකි,
(1) මුසෛලසමා (2) සජාහ් (3) තුලෛහා (4) අස්වද් අන්සි

(22) අල්ලාහ්ට ආදේශ කිරීම
(1) කුෆ්ර් (2) ෂිර්ක් (3) රිද්දත් (4) නිෆාක්

(23) "කුෆ්ර්" ඇතිවන ක්‍රම
(1) තුනකි (2) සතරකි (3) දෙකකි (4) හතකි

(24) නබි (හල්) තුමාගේ බොහෝ නම් අතරින් "ආකිබ්" යනු,
(1) විනාශකර දමන්නා (2) එක් රැස් කරන්නා (3) අවසානයා (4) විශ්වාසවන්තයා

(25) "අවම ප්‍රමාණය" යනු වචනයෙහි අරාබි පදය,
(1) හිසාබ් (2) හව්ල් (3) සකාත් (4) නිසාබ්

(26) සකාත් එක්රැස්කරන කටයුතුවල නිරතවන පුද්ගලයා
(1) මිස්කීන් (2) ආමිල් (3) ඉබ්නු සබීල් (4) ගාරිමුන්

(27) සකාත් ලැබීමට නුසුදුසු කණ්ඩායමක් වන්නේ,
(1) ෆකීර් (2) අර්රිකුබ් (3) වහල්ලු (4) මුඅල්ලෆතුල්කුලබ්

(28) "ඉබාදත්" යනු
(1) පොළොව සරු කිරීම (2) පාලනය කිරීම
(3) අවනතවීම (4) සලාතය ඉටු කිරීම

(29) ආගම් හා සුනුෆ් පහළ කරන ලද නබිවරයෙකි,
(1) මුසා (අලෛ) (2) ෂීද් (අලෛ) (3) ඊසා (අලෛ) (4) ආදම් (අලෛ)

(30) ජලයෙහි කුල්ලතෛන් යනු,
(1) ලීටර් 209 (2) ලීටර් 210 (3) ලීටර් 270 (4) ලීටර් 220

(31) "අධික ජලය" සඳහන් කරන පදය
(1) අල්මාඋල් කලීල් (2) මාඋන්නජිස් (3) අල්මාඋල් කසීර් (4) මාඋත්තාහිර්

(32) තයම්මුම්හි අවයවයන් වන්නේ,
(1) මුහුණ හා දෑත් (2) මුහුණ හා පාද (3) මුහුණ හා කට (4) මුහුණ, දෑත් හා කන

(33) තුවාලයක් සඳහා දමන ලද වෙළුම
(1) ජනාබත් (2) ජබීරත් (3) තයම්මුම් (4) සුළු කිල්ල

(34) සාමාන්‍ය නැජිස්හි අඩංගු නොවන දෙයකි
(1) මුත්‍ර (2) වමනය (3) බල්ලාගේ සැරව (4) මත්පැන්

(35) ස්වර්ගයේ යතුර වන්නේ,
(1) සව්මය (2) හජ් (3) උම්රාව (4) සලාතය

(36) "දුආඋල් ඉෆ්තිතාහ්" යනු,
(1) සුරා ෆතිහා (2) සුරා ඉඛ්ලාස් (3) වජ්ජහ්තු (4) අත්තහියියාත්

(37) නිමක් නොමැති පරලොව ජීවිතය සඳහන් කරන අරාබි පදය
(1) දාරුල් ෆනා (2) දාරුල් අර්කම් (3) දාරුස්සකන් (4) දාරුල් බකා

(38) පේෂ කර්මාන්තය හා සම්බන්ධ නබිවරයෙකි,
(1) ඉද්රීස් (අලෛ) (2) දාවුද් (අලෛ) (3) මුසා (අලෛ) (4) ආදම් (අලෛ)

(39) වඩු කර්මාන්තය සමඟ සම්බන්ධ වූ නබිවරයා
(1) ඉද්රීස් (අලෛ) (2) නුහ් (අලෛ) (3) දාවුද් (අලෛ) (4) ආදම් (අලෛ)

(40) ජාහිලිය්යා යුගයේ "කබීලා" යනු,
(1) නායකයා (2) පොකුර (3) ගෝත්‍ර (4) සටන

(ලකුණු 2 x 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය - II

නම/විභාග අංකය :- ...................................................... කාලය: පැය 02 යි.

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද, අනෙකුත් එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) අකීදා යනු කුමක් ද?

(ii) මුඃතසිලා චින්තනයට විරුද්ධව සටන් කළ ඉමාම්වරයා නම් කරන්න.

(iii) අකීදාවට පටහැනිව නිර්මාණය වූ කණ්ඩායම් හතරක් නම් කරන්න.

(iv) වලී වරුන්ට ලබා දී ඇති ආශ්චර්ය කුමක් ද?

(v) ඊමානයට හානි කරන කරුණු හතරක් සඳහන් කරන්න.

(vi) ෂිර්කුල් අක්බර්හි කොටස් දෙක කුමක් ද?

(vii) කලාකද්ර් සම්බන්ධ තාර්කිකයන්ගේ අදහස් දෙක කුමක් ද?

(viii) සකාත් යන වචනයෙහි භාෂාමය අර්ථයන් දෙකක් ලියන්න.

(ix) සකාත් හි ෆර්ලයන් සඳහන් කරන්න.

(x) හජ්, උම්රා ඉටු කරන ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 x 10 = 20)

(02) (i) විශ්වාස කරන කරුණු හය කොටස්කර ඇති මාතෘකා හතර සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) අක්දාවෙහි පාරිශුද්ධතාව ආරක්ෂා කිරීමට දායකත්වය ලබාදුන් ඉමාම්වරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(iii) අකීදාවට පටහැනිව කණ්ඩායම් බිහි වීමට හේතු පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(03) (i) අහ්ලුස් සුන්නා වල් ජමාආ යන්නෙන් අදහස් කරන්නේ කවුරුන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) තව්හීද් යන අදහස විස්තර කරන ආකාර තුන සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) මුර්තද් කෙනෙකු සම්බන්ධව ඉස්ලාම් පවසන ක්‍රමවේද පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(04) (i) ෂිර්ක් හි කොටස් දෙක නිදසුන් සමග සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) කුෆ්ර් ඇති කරන ආකාර තුන නිදසුන් සමග පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) අවසන් නබිත්වය සනාථ කරන අල්කුර්ආන් වැකියකු හා හදීසයක් ද සඳහන් කරන්න. (ලකුණු 05)

(05) (i) ඉතිහාසයේ බිහිවූ ව්‍යාජ නබිවරුන් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) ව්‍යාජ නබිවරු තමන්ගේ ප්‍රචාරය සඳහා භාවිත කළ මාර්ගයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සකාත් අනිවාර්යවන ද්‍රව්‍යයන් සඳහන් කරන්න. (ලකුණු 05)

(06) (i) සව්මිහි ෆර්ලයන් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පෙර මිනුම විශ්වාස කිරීම මගින් ලැබෙන ප්‍රයෝජනයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සකාත් සාමූහිකව ගෙවීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජනයන් පහක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් තේමාවන් ගෙන් දෙකක් තෝරා කෙටියෙන් විස්තර කරන්න.

(i) උපවාසයෙන් ලැබෙන ප්‍රයෝජන

(ii) පාපී ක්‍රියා සම්බන්ධව අහ්ලුස් සුන්නා වල්ජමාආවෙහි ස්ථාවරය

(iii) ඉල්හාද්

(iv) හජ්හි ප්‍රයෝජන (ලකුණු 05 x 2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (11) | 3 | (21) | 1 | (31) | 3 |
| (02) | 2 | (12) | 4 | (22) | 2 | (32) | 1 |
| (03) | 4 | (13) | 3 | (23) | 1 | (33) | 2 |
| (04) | 1 | (14) | 2 | (24) | 3 | (34) | 3 |
| (05) | 2 | (15) | 3 | (25) | 4 | (35) | 4 |
| (06) | 3 | (16) | 2 | (26) | 2 | (36) | 3 |
| (07) | 4 | (17) | 1 | (27) | 3 | (37) | 4 |
| (08) | 2 | (18) | 4 | (28) | 3 | (38) | 1 |
| (09) | 1 | (19) | 1 | (29) | 1 | (39) | 2 |
| (10) | 2 | (20) | 3 | (30) | 2 | (40) | 3 |

(ලකුණු 02 x 20 = 40)

### II පත්‍රය

(01) (i) විශ්වාසය

(ii) ඉමාම් අහ්මද් ඉබ්නුහන්බල් (රහ්)

(iii) ජබරියියා, කදරිය්යා, මූර්ජිආ, ෂීආ

(iv) කරාමත්

(v) ඉල්හාද්, කුෆ්ර්, ෂීර්ක්, රිද්දත්, තිෆාක්

(vi) ෂිර්කුල් ජලී, ෂිර්කුල් කෆී

(vii) මිනිසාගේ කැමැත්තකට ප්‍රමුඛත්වය දීම / මිනිසාගේ කැමැත්ත ප්‍රතික්ෂේප කිරීම

(viii) දියුණුව, සංවර්ධනය

(ix) නිය්යත් තැබීම, සුදුස්සන්ට ලබා දීම

(x) අල්කිරාන්, අල්ඉෆ්රාද් අත්තමත්තුල (ලකුණු 02 x 10 = 20)

(02) (i) අල්ඉලාහිය්යාත්, අන්නුබුව්වාත්, අර්රූහානිය්යාත්, අස්සම්ඉය්යාත් (ලකුණු 02)

(ii) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්), ඉමාම් අබුල්හසන් අල් අජ්අරී (රහ්), ඉමාම් අබුමන්සූර් අල් මාත්රුදී (රහ්) (ලකුණු 03)

(iii) දේශපාලනික අර්බුදය/ විචාර බුද්ධියෙහි සීමාව ඉක්මවීම/ ආගම් අතර ඇතිවුණු සම්බන්ධතා / ස්ව කැමැත්ත අනුව ක්‍රියා කිරීම / මිත්‍යා විශ්වාසය (ලකුණු 05)

(03) (i) නබි (සල්) තුමාද සහාබාවරුන් ද ජීවත් වූ ක්‍රමය අනුගමනය කිරීම. (ලකුණු 02)

(ii) - සියල්ලෙහි මැවුම්කරු අල්ලාහ්මය
- නැමදීමට සුදුස්සා අල්ලාහ් ම පමණි
- අල්ලාහ් පරිපූර්ණවන්තයාය. කිසිඳු අඩුපාඩුවක් නොමැත්තා ය. (ලකුණු 03)

(iii) - ඔහුගේ බිරිඳ ඔහු අත්හැර වෙන්වී යයි.
- දේපල උරුම නොලැබේ.
- ජනාසා සලාතය ඉටු කරන්නේ නැත.
- මුස්ලිම් සුසාන භූමියේ වලලනු නොලැබේ.
- ඔහු ධර්මද්‍රෝහියකු ලෙස සලකනු ලබයි. (ලකුණු 05)

(04) (i) - ෂිර්ක් අක්බර් (මහා ෂිර්ක්), අල්ලාහ් හැර වෙනත් දේවල්වලට නැමදීම, ප්‍රාර්ථනා කිරීම, භාරවීම.
- ෂිර්ක් අස්හර් (සුළු ෂිර්ක්) ව්‍යාජ ලෙස දිවිරීම, වශීකිරීම, සාස්තර බැලීම. (ලකුණු 02)

(ii) විශ්වාසය හා සම්බන්ධ, වචනය හා සම්බන්ධ, ක්‍රියා හා සම්බන්ධව (ලකුණු 03)

(iii) "මට පසු අහ්මද් නමින් රසූල් වරයෙක් පැමිණෙන්නේ යා යන ශුබාරංචියේ මම පවසමි යයි..." (අස්සෆ් : 6)
11 ශ්‍රේණිය ඉස්ලාම් පොතේ 16 වැනි පිටුවේ තිබෙන ඕනෑම හදීසියක් හෝ කොටසක් ලියා ඇත්නම්
(ලකුණු 05)

(05) (i) අස්වතුල් අන්සි, මුසෙලමා, සජාන්, තුලෙහා (ලකුණු 02)

(ii) - අල්කුර්ආන්, සුන්නාන්වට වැරදි අර්ථකථන ලබා දීම.
- ව්‍යාජ හදීස් ගොඩනැගීම
- මූලික විශ්වාසවල සැක ඉස්මතු කිරීම. (ලකුණු 03)

(iii) ධාන්‍ය වර්ග, පලතුරු වර්ග, ඛනිජ වර්ග, මුදල්, වෙළඳ භාණ්ඩ, පශු සම්පත් (ලකුණු 05)

(06) (i) - නිස්යත් තැබීම
- අරුණෝදය සිට (අලුයම) හිරු බැස යන තුරු ආහාර පාන තහනම් කරන ලද සියලුම දේවල්වලින් වැළකී සිටීම. (ලකුණු 02)

(ii) - සෑම විටම තෘප්තිමත් මනසක් ඇත්තකු සේ සිටීමට හැකි වීම.
- ඉවසීම වර්ධනය වීම
- සිත් තැවුලට පත්වන්නේ නැත.
- තව තව උත්සාහ කිරීමට හැකිවීම (ලකුණු 03)

(iii) - දුගින්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කිරීම
- දුගීබව නැති කිරීමට විශාල වැඩසටහන් සැලසුම් කිරීමට හැකිවීම
- ධනවතුන් සකාත් වග කීමෙන් මිදී නොසිටීමට මග පෙන්වයි.
- සමාජයේ අන්‍යෝන්‍ය සෙනහස, සාමූහික වගකීම වර්ධනය වීම.
- සොරකම්, මංකොල්ල වැනි අපරාධ පිළිබඳ බිය පහව ගොස් ජන සමාජයට සැනසීමෙන් හා ආරක්ෂාවෙන් සිටීමට හැකි වේ. (ලකුණු 05)

(07) (1) උපවාසයේ ප්‍රයෝජන
ආධ්‍යාත්මික දියුණුව, දායාද හඳුනා ගැනීම, දුගීන්ගේ දුෂ්කරතා හඳුනාගැනීම, ශාරීරික නිරෝගීබව හිමිවේ, අල්ලාහ් කෙරෙහි මුළුමනින් ම අවනත වීමේ පුහුණුව ලැබීම. (මෙවැනි කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 05)

(2) අහ්ලුස්සුන්නා වල්ජමාආ පාඩමේ පිටු අංක 6 දී බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(3) ඉල්හාද් - 4 වන පාඩමේ පිටු අංක 11 හා 12 බලන්න. (ලකුණු 05)


(4) හජ්හි ප්‍රයෝජන 9 වැනි පාඩමේ 43 වැනි පිටුව බලන්න. (ලකුණු 05)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371









































Online shopping

www.lol.lk
Learn Ordinary Level

DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

**LOL.lk**
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්











## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්

ගෙදරටම ගෙන්ව ගන්න

ඔන්ලයින් ඔඩර් කරන්න

WWW.LOL.LK

වෙත යන්න

BUY NOW

ONLINE BOOK STORE

An evening of fun for young readers